[සියලු ම හිමිකම් ඇවිරිණි]
[முழுப் பதிப்புரிமை உடையது]
[All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය/Ministry of Education - Division of Piriven Education/கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு

පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2023 (2024)

03	S	I

පැ. දෙකයි.

02 ශ්‍රේණිය

අමතර කියවීම් කාලය - මිනිත්තු 10

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

(3) ත්‍රිපිටක ධර්මය

සැලකිය යුතුයි :
- මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 100 ක් ලැබේ.
- දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.
- I, II කොටස්වල ප්‍රශ්න සියල්ලට ම ද, III කොටසින් තෝරාගත් ප්‍රශ්න හතරකට ද පමණක් පිළිතුරු සපයන්න.

I - කොටස

- **අංක 01 සිට 10 තෙක් එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.**

1. රජ සැප හැරදමා, සත්‍යය සොයා ගිය සිදුහත් බෝසතාණන් වහන්සේට පළමු ව .... තාපසතුමා හමු විය.
   (1) ආළාරකාළාම (2) උරුවේල කාශ්‍යප (3) උද්දකරාම පුත්ත
2. බුදුරජාණන් වහන්සේ තම සිරුරින් සවණක් ගණ බුද්ධ රශ්මිය විහිදුවමින් අභිධර්මය මෙනෙහි කරනු ලැබුයේ ....
   (1) අජපාල නුගරුක මුල වැඩ සිටිමින් ය.
   (2) මුචලින්ද සෙවනෙහි වැඩ සිටිමින් ය.
   (3) රුවන්ගෙයි වැඩ සිටිමින් ය.
3. තපස්සු සහ භල්ලුක වෙළඳ දෙබෑයෝ බුදුරජාණන් වහන්සේ දැක පැහැදී .... පූජා කළහ.
   (1) කුසතණ (2) කිරි පිඬු (3) විළඳ සහ මී පිඬු
4. බුදුරාජාණන් වහන්සේ ත්‍රිලක්ෂණය ඇතුළත් .... දේශනා කළ සේක.
   (1) අනන්තලක්ඛණ සූත්‍රය (2) දසධම්ම සූත්‍රය (3) මහා පරිනිබ්බාන සූත්‍රය
5. තුන්බෑ ජටිලයන් අතරින්, නදී කාශ්‍යප ඇතුළු පිරිස රහත්භාවයට පත් වූයේ .... ශ්‍රවණය කිරීමෙන් පසු ය.
   (1) තිරෝකුඩ්ඩ සූත්‍රය (2) ආදිත්ත පරියාය සූත්‍රය (3) ලක්ඛණ සූත්‍රය
6. බුදුරජාණන් වහන්සේගේ පළමු ලංකා ගමනය සිදු වූයේ .... පුර පසළොස්වක පෝහෝ දිනයේදී ය.
   (1) දුරුතු (2) නවම් (3) මැදින්
7. බුදු සසුනේ ප්‍රථම .... උපාසක තුමා වූයේ බරණැස් සිටුතුමා ය.
   (1) අග්‍ර උපස්ථායක (2) තේවාචික (3) ද්වේවාචික
8. මහා ධර්මපාල ජාතකය දේශනා කොට වදාළේ .... රජු අරභයා ය.
   (1) බිම්බිසාර (2) සුද්ධෝදන (3) කොසොල්
9. සුමන සමන් දිව්‍ය රාජයා බුදුරජාණන් වහන්සේගෙන් පිදීමට වස්තුවක් ඉල්ලා සිටි අවස්ථාවේ, තම හිස පිරිමැද කේසධාතු මිටක් ලබා දුන්හ. හෙතෙම එය තැන්පත් කොට .... ඉදි කළේය.
   (1) නාගදීප චෛත්‍යය (2) කැලණි චෛත්‍යය (3) මහියංගණ චෛත්‍යය
10. යශෝදරා මහරහත් තෙරණිය සම්බුද්ධ සාසනයේ .... අග තනතුර ලැබුවා ය.
    (1) ප්‍රඥාවන්ත භික්ෂුණීන් අතර (2) චිරරාත්‍රඥ භික්ෂුණීන් අතර (3) විනයධර භික්ෂුණීන් අතර

(ලකුණු 2 X 10 = 20)

II - කොටස

[2 වැනි පිටුව බලන්න]

02. පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

i. චණ්ඩාශෝක රජු, නිග්‍රෝධ සාමණේරයන් වහන්සේ කෙරෙහි පැහැදීමට හේතු **දෙකක්** ලියන්න.
ii. සිවුවනක් පිරිස අතරින් **දෙපිරිසක්** නම් කරන්න.
iii. පංචානන්තරිය පාප කර්ම අතරින් **දෙකක්** ලියන්න.
iv. දේවදත්ත හිමියන් විසින් බුදුරජාණන් වහන්සේගෙන් ඉල්ලූ පංචවරය අතරින් **දෙකක්** ලියන්න.
v. ත්‍රිවිද්‍යා අතරින් **දෙකක්** ලියන්න.
vi. චතුරාර්ය සත්‍යය අතරින් **දෙකක්** ලියන්න.
vii. අස්සජී තෙරුන්ගේ මග පෙන්වීමෙන් ධර්ම මාර්ගයට පිවිසි ශ්‍රාවකයන් **දෙදෙනා** නම් කරන්න.
viii. කොසඹෑනුවර ඝෝෂිතාරාමයේ දී තථාගතයන් වහන්සේ වදාළ **ජාතක කථා දෙක** නම් කරන්න.
ix. අෂ්ට ගරුධර්ම අතරින් දෙ**කක්** නම් කරන්න.
x. තථාගතයන් වහන්සේ විසින් දේශිත අත්හල යුතු අන්ත **දෙක** නම් කරන්න.

(ලකුණු 2 X 10 = 20)

III කොටස

03. i. පහත සඳහන් ගාථාවලින් දෙකක් සම්පූර්ණ කරන්න.

a) සාරං ච සාරතො ඤත්වා ....
b) අප්පමාදො අමත පදං ....
c) පතිරූප දෙස වාසො ච ....
d) දුන්නිග්ගහස්ස ලහුනො ....

ii. **නහි වේරෙන වේරානි** යන ගථාවට අදාළ නිදාන කතාව ලියන්න.

(ලකුණු 10 + 5 = 15)

04. i. දෙතිස් කුණප අතරින් **පහක්** නම් කරන්න.
ii. පිළිකුල් භාවනාව වඩන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 5 + 10 = 15)

05. i. මහා මංගල සූත්‍රය දේශනා කිරීමට අදාළ නිදාන කථාව ලියන්න.
ii. **අසේවනා ච බාලානං - පණ්ඩිතානං ච සේවනා** ගාථා පාඨය ඇසුරින් සඟරාවකට ලිපියක් ලියන්න.

(ලකුණු 5 + 10 = 15)

06. i. ශක්‍ර දේවේන්ද්‍රත්වයට පත්වීමට පිරිය යුතු පිළිවෙත් **පහක්** ලියන්න.
ii. සක් දෙවිඳුට එම පදවිය ලැබීමේ කතා පුවත විස්තර කරන්න.

(ලකුණු 5 + 10 = 15)

07. i. තුදුස් වත් අතරින් **පහක්** නම් කරන්න.
ii. ඒවායෙන් **එකක්** පිළිබඳ විස්තර කරන්න.

(ලකුණු 5 + 10 = 15)

08. i. මහා ධර්මපාල ජාතකය ඇසුරින් අඩු වයසින් මරණයට පත් නොවීමට හේතු වන කරුණු **තුනක්** උපුටා දක්වන්න.
ii. **සීලවිමංස ජාතකය** ඇසුරෙන් සිල් රැකීමේ අගය විස්තර කරන්න.

(ලකුණු 7 + 8 = 15)

* * *